සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය | **ඉතිහාසය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. ලන්දේසීන්ගේ මව් රට වූයේ ..... යි. (ඕලන්දය / පෘතුගාලය)

02. ..... නම් ලන්දේසී ජාතික අද්මිරාල්වරයා ලංකාවේ මඩකලපුව වරායට ගොඩ බසින ලදී. (ජොරිස් වැන් ස්පිල්බර්ජන් / සිබල් ද වර්ට්)

03. ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ..... ය. (රොබට් බ්‍රවුන්රිග් / පෙඩ්රික් නෝත්)

04. 1848 දෙවන නිදහස් සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ ..... ප්‍රදේශය යි. (මාතලේ / ඌව වෙල්ලස්ස)

05. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් පවත්වන ලද වාදවිවාද අතරින් ..... ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් විය. (උදන්විට වාදය / පානදුරා වාදය)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. හියු බොයිඩ් පැමිණෙන විට උඩරට පාලකයා වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය. ( )

07. 1815 මාර්තු 02 දින උඩරට ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ ඉංග්‍රීසි කොඩිය බිම දමා සිංහල කොඩිය එස වූයේ වාරියපොල සුමංගල හිමියන් විසිනි. ( )

08. මිෂනාරීන් සිය ආගම ප්‍රචාරය සඳහා ලංකා නිධානය නම් ප්‍රකාශනය නිකුත් කරන ලදී. ( )

09. පරම විඥානාර්ථ සමාගම නමින් සංවිධානයක් පිහිටු වීම හෙන්රි ස්ටීල් ඔල්කට්තුමාගේ මග පෙන්වීම මත සිදුවිය. ( )

10. ටී. බී. ජයා බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නායකයෙකි. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. පෙරදිග ඕලන්ද වෙළඳ සමාගමේ පෙරදිග මූලස්ථානය වූයේ,

    (1) බොම්බාය (2) බතාවිය (3) ගෝව (4) මදුරාසිය

12. මෙරට ලන්දේසී අධිකරණ පද්ධතියේ ඉහළම උසාවිය වූයේ,

    (1) රාද් වෑන් ජස්ටිට් (2) පිස්කල් උසාවිය (3) සිවිල් රාද් (4) ලෑන් රාද්

13. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගෙන් සිදු වූ වැදගත් ම සේවාවක් ලෙස සැලකෙන්නේ,

    (1) මාළිගාකන්ද විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීම.

    (2) පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීම.

    (3) රත්මලාන පරමධම්ම චේතිය පිරිවෙන ආරම්භ කිරීම.

    (4) පංච මහාවාදය මෙහෙය වීම.

14. ඉන්දියානු ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ කවු ද?

    (1) සී. ආර්. දාස් (2) සුරේන්ද්‍රනාත් බැනර්ජි

    (3) ඩබ්. සී. බෙනර්ජි (4) මොහොමඩ් අලි ජින්නා

15. ඉන්දියාවේ සම්භාවනීය මහල්ලා යන අනර්ථ නාමයෙන් හඳුන්වනු ලැබුවේ කවුරුන් ද?

    (1) මහත්මා ගාන්ධි තුමා (2) ජවහර්ලාල් නේරු

    (3) මවුලානා අබුල් කලාම් අසාද් (4) දඩාභායි නඕරෝජි

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස් තැනට සුදුසු පිළිතුරු ලියන්න.**

16. 1796 - 1798 දක්වා පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම යටතේ මුහුදුබඩ ප්‍රදේශයේ බදු එකතු කිරීමට ..... නම් නිලධාරීන් පත් කළේ ය.

17. 1948 ඉංග්‍රීසි විරෝධී සටන අවස්ථාවේ දී ..... ශ්‍රී සර්වසිද්ධි නමින් දඹුල්ලේ දී ඔටුනු පැළඳ විය.

18. තේ වගාව පිළිබඳ මුලින් ම අත්හදා බැලීම කළේ ..... නැමැත්තා විසිනි.

19. ක්‍රි. ව. 1900 වර්ෂයේ දී ..... ආණ්ඩුකාරවරයා විසින් වාරි මාර්ග දෙපාර්තමේන්තුව පිහිටු වීයඩි

20. ඉංග්‍රීසීන් යටතේ හමුදා සේවයට බඳවාගෙන සිටි ඉන්දියානුවන් ..... ලෙස හැඳින් විය.

(ල. 20 × 2 = 40)

09 ශ්‍රේණිය **ඉතිහාසය - II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. (අ) සපයා ඇති ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ලන්දේසීන් උඩරට රජුට භාර නොදුන් ගාලු බලකොටුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) ක්‍රි. ව. 1848 දෙවන නිදහස් අරගලයේ ප්‍රධාන මධ්‍යස්ථානය වූ මාතලේ ප්‍රදේශය දැක්වෙන අක්ෂරය ලියන්න.

(iii) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට අත්පත් කර ගැනීමට නොහැකි වූ මහනුවර නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද කලා වැව දැක්වෙන අක්ෂරය

(ලකුණු 04)



(ආ) සපයා ඇති ලෝක සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) ලංදේසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය වූ ජාවා දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) පෘතුගීසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය වූ ඉන්දියාවේ ගෝව දැක්වෙන අක්ෂරය ලියන්න.

(iii) ඉංග්‍රීසීන්ගේ මව් රට වූ බ්‍රිතාන්‍ය දැක්වෙන අක්ෂරය ලියන්න.

(iv) බෙංගාල බොක්ක ප්‍රදේශය දැක්වෙන අක්ෂරය ලියන්න. (ලකුණු 04)

- දී ඇති **A** හා **B** පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.

(ඇ) (i) A පින්තූරයේ දැක්වෙන රජතුමා කවු ද?

(ii) මෙතුමා ලංකාවේ කවර රාජධානියක පාලකයා වී ද?

(iii) ඔහු හැඳින්වීමට භාවිත කළ ගෞරව නාමය කුමක් ද?

(iv) ඔහු හා සම්බන්ධ ගොඩ නැගී ඇති ප්‍රස්තාව පිරුළ කුමක් ද?

(ලකුණු 04)

A

(ඈ) (i) B පින්තූරයේ දැක්වෙන පුද්ගලයා කවු ද?

(ii) ඔහු ජීවත් වූ රට කුමක් ද?

(iii) එතුමා නීතිඥයකු ලෙස සේවය කළ විදේශ රට කුමක් ද?

(iv) එතුමා අනුගමනය කළ මානව හිතවාදි ප්‍රතිපත්තිය කුමක් ද?

(ලකුණු 04)



B

02. (i) ශ්‍රී ලංකාවේ ලන්දේසීන් යටතේ පැවති පාලන ප්‍රදේශ 03 ක් ලියන්න. (ලකුණු 03)

(ii) ලන්දේසීන්ට පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම පිහිටු වීමේ බලපත්‍ර ලබා දුන් පසු එම සමාගමට ලැබුණු බලතල 04 ක් ලියන්න. (ලකුණු 04)

(iii) 1638 දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් සමඟ ඇතිකරගත් ගිවිසුමේ වගන්ති 04 ක් ලියන්න.

(ලකුණු 04)

03. (i) දහ අටවන සියවස වන විට බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බල පෑ හේතු 03 ක් ලියන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සිදු වීමවලට අදාළ පිළිතුර A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.

A. කිව් ලිපිය ලැබෙන විට ලංකාවේ සිටි ලංදේසී ආණ්ඩුකාරවරයා

B. 1797 මුහුදුබඩ කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසම

C. 1803 උඩරට ආක්‍රමණය මෙහෙය වූ සෙනෙවිවරයා

D. 1815 උඩරට යටත් කර ගැනීමට උපායශීලිව කටයුතු කළ සිවිල් නිලධාරීයා (ලකුණු 04)

(iii) 1803 ඉංග්‍රීසීන්ගේ ප්‍රථම උඩරට ආක්‍රමනය අසාර්ථක වීමට හේතු 04 ක් ලියන්න. (ලකුණු 04)

04. (i) 1818 නිදහස් සටනට බලපෑ හේතු 03 ක් ලියන්න. (ලකුණු 03)

(ii) 1848 නිදහස් සටනේ විරෝධතාවට ලක් වූ බදු වර්ග 04 ක් ලියන්න. (ලකුණු 04)

(iii) 1848 නිදහස් සටනට බලපෑ කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා 04 ක් ලියන්න. (ලකුණු 04)

05. (i) වතු වගාව යටතේ මෙරට ආරම්භ වූ වතු භෝග 3 ක් ලියන්න. (තේ හැර) (ලකුණු 03)

(ii) තේ වගාවේ උන්නතියට බල පෑ හේතු 04 ක් ලියන්න. (ලකුණු 04)

(iii) බ්‍රිතාන්‍යයන් දේශීය කෘෂි කර්මාන්තය නගා සිටු වීමට ගන්නා ලද ක්‍රියා මාර්ග 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

06. (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම සඳහා මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන 03 ක් ලියන්න. (ලකුණු 03)

(ii) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 04 ක් ලියන්න. (ලකුණු 04)

(iii) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගෙන් ජාතික පුනරුදයට ලැබුණ සේවය පිළිබඳ වාක්‍ය 04 ක් ලියන්න. (ලකුණු 04)

07. (i) ඉන්දියානු නිදහස් සටනේ නායකයන් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) සිපොයි කැරැල්ල ඇති වීමට හේතු 04 ක් ලියන්න. (ලකුණු 04)

(iii) ඉන්දියානු නිදහස් සටනේ නායකයෙක් වූ මහත්මා ගාන්ධිතුමා පිළිබඳ වාක්‍ය 04 ක් ලියන්න. (ලකුණු 04)

පිළිතුරු පත්‍රය - I කොටස

01. ඕලන්දය 02. ජොරිස් වැන් ස්පිල්බර්ජන් 03. පෙඩ්රික් නෝර්ත් 04. මාතලේ
05. පානදුරා වාදය 06. ✗ 07. ✓ 08. ✓ 09. ✓ 10. ✗
11. 2 12. 1 13. 1 14. 3 15. 4
16. අවුමිල්දාර්වරු 17. ගොංගාලේ ගොඩ බණ්ඩා 18. ජේම්ස් ටේලර් 19. වෙස්ට් රිජ්වේ
20. සිපොයි හමුදාව

II කොටස

(2 x 20 = ල. 40)

01. (අ) (i) F (ii) D (iii) E (iv) C (ලකුණු 04)
(ආ) (i) C (ii) B (iii) A (iv) D (ලකුණු 04)
(ඇ) (i) දෙවන රාජසිංහ රජතුමා (ii) මහනුවර (iii) ශ්‍රී සිංහලාධීශ්වර
(iv) ඉගුරු දී මිරිස් ගත්තා වගෙයි. (ලකුණු 04)
(ඈ) (i) මහත්මා ගාන්ධිතුමා (ii) ඉන්දියාව (iii) දකුණු අප්‍රිකාව
(iv) අවිහිංසාවාදී ප්‍රතිපත්තිය (ලකුණු 04)

02. (i) කොළඹ කොමාන්ඩරිය, ගාලු කොමාන්ඩරිය, යාපනය කොමාන්ඩරිය (ලකුණු 03)
(ii) ඕලන්ද රජය වෙනුවෙන් ආ ආසියාවේ වෙළඳාම් කිරීම, ප්‍රදේශ යටත් කිරීම, බලකොටු ඉදි කිරීම, ආණ්ඩුකාරවරු පත් කිරීමට හා අදාළ ප්‍රදේශය පාලනය කිරීමට (පි. 05) (ලකුණු 04)
(iii) පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීමට රජුට සහය දීමට ලංදේසීන් එකඟ වීම. / පෘතුගීසීන්ට එරෙහි සටන්සඳහා ලන්දේසීන්ට වැයවන මුදල් කුරුඳු, ගම්මිරිස්, ... ආදී වෙළඳ ද්‍රව්‍ය වලින් පියවීමට රජු එකඟ වීම. / ඇතුන් හැර උඩරට සෙසු වෙළඳ ද්‍රව්‍ය මිල දී ගැනීමේ ඒකාධිකාරී අයිතිය ලංදේසීන්ට ලබා දීම. / රජු අදහස් කරන්නේ නම් පෘතුගීසීන්ගෙන් අල්ලා ගන්නා බලකොටුවල ලන්දේසි හමුදාව නතර කර වීමට එකඟ වීම. (පි. 04) (ලකුණු 04)

03. (i) ලංකාවේ පිහිටීමේ වැදගත්කම, ත්‍රිකුණාමල වරායේ වැදගත්කම, වෙළඳ කටයුතුවල දී ලංකාවේ තිබූ වැදගත්කම (පි. 22) (ලකුණු 03)
(ii) A. ෆන් ඒංගල්බෙක් B. ද මියුරන් කොමිසම C. මැක්ඩොවල්
D. ජෝන් ඩොයිලි (ලකුණු 04)
(iii) වර්ෂා කාලය එළඹීම නිසා කොළඹ මහ නුවර සබඳතා පැවැත් වූ මාර්ග අවහිර වීම නිසා / බෙහෙත්, ආහාර නොලැබී යාම නිසා, මැලේරියාව වැනි රෝග පීඩා, උඩරැටියන්ගේ සටන් උපක්‍රම (පි. 28) (ලකුණු 04)

04. (i) රජෙකු නොමැති වම නිසා ජනතාව තුළ ඇති වූ කලකිරීම බුදු දහම විනාශ වෙතැයි ඇති වූ බය / දේශීය සම්ප්‍රදායන් සිරිත් විරිත් නොසලකා හැරීම / රදල ප්‍රධානීන්ගේ බලතල වරප්‍රසාද ආදායම් මාර්ග සුරක්ෂිත නොවීම / ඌව වෙල්ලස්සට මුස්ලිම් මුහන්දිරම්වරයෙක් පත් කිරීම (පි. 35) (ලකුණු 03)
(ii) මුද්දර බද්ද, බලු බද්ද, ඔරු බද්ද, තුවක්කු බද්ද, කරත්ත බද්ද, ඇග බද්ද, වෙළඳසැල් බද්ද (පිට. 39) (ලකුණු 04)
(iii) ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය / මුඩු බිම් පනත / වතුවගාව කෙරෙහි අවධානය යොමු කිරීම නිසා දේශීය කෘෂිකර්මාන්තය පිරිහීම, ගම් සභාව අඩපණ වීම, රජය හා මහජනතාව අතරදුරස් බව, (පි. 38) (ලකුණු 04)

05. (i) කෝපි, සිංකෝනා, කොකෝවා, පොල්, රබර් (පි. 44) (ලකුණු 03)
(ii) තේ වගාවට උචිත පරිසරයක් තෙත් කලාපයේ පැවතීම / ලංකාවේ තේ සඳහා ලන්ඩන් හා ලෝක වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් පැවතීම / දුම්රිය හා මහා මාර්ග පහසුකම් දියුණු වීම / ලාභදායී ශ්‍රමය සපයා ගත හැකි වීම. / අඩු නිෂ්පාදන වියදමකින් වැඩි ලාභ ලැබිය හැකිවීම. (පි. 47) (ලකුණු 04)
(iii) වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම. / වාරි මාර්ග දෙපාර්තුමේන්තු පිහිටු වීම. / සමූපකාර සමිති පිහිටු වීම. (පි. 50) (ලකුණු 04)

06. (i) ලන්ඩන් මිෂනාරි සමාගම / බැප්ටිස්ට් මිෂනාරි සමාගම / වෙස්ලියන් මිෂනාරි සමාගම / ඇමරිකන් මිෂනාරි සමාගම / චර්චි මිෂනාරි සමාගම (පි. 54) (ලකුණු 03)
(ii) පිරිවෙන් පිහිටු වීම, මුද්‍රණාල පිහිටු වීම හා මුද්‍රිත මාධ්‍ය යොදා ගැනීම, වාද විවාද පැවැත් වීම, බෞද්ධ පාසල් පිහිටු වීම, දේශීය සංස්කෘතිය රැකගැනීමට කටයුතු කිරීම. (පි. 57) (ලකුණු 04)
(iii) හෙන්රි ස්ටිල් ඕල්කට් තුමාගේ සේවා ලියා ඇත්නම් ලකුණු දෙන්න. (පි. 62) (ලකුණු 04)

07. (i) මහත්මා ගාන්ධි, දඩාභායි නඕරෝජි, සුරෙන්ද්‍රනාත් බැනර්ජි, බාල් ගංගාධාර් තිලක්, ජවහල්ලාල් නේරු, මවුලානා අබ්දුල් කලාම් අසාද් (ලකුණු 03)
(ii) ඉංග්‍රීසින් ඉන්දියානු ප්‍රදේහ අත්පත් කර ගැනීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති කෙරෙහි ඉන්දියානුවන් තුළ පැවති විරෝධය,, වෙළඳ සමාගම ගෙන ගිය පාලනය පිළිබඳ පැවති කලකිරීම./ වෙළඳ සමාගමේ ආර්ථික ප්‍රතිපත්ති නිසා දේශීය කර්මාන්ත අභාවයට යාම, ස්වදේශීක ආගම් නොසලකා හැරීම. / සිපොයි භටයන් තුළ පැවැති කළකිරීම. (පි. 75) (ලකුණු 04)
(iii) මහත්මා ගාන්ධි තුමා පිළිබඳ වාක්‍ය 04 ක් (පි. 93) (ලකුණු 04)